අන්තර්ජාතික ප්‍රාචීන භාෂා පර්යේෂණ සමුළුව

# INTERNATIONAL CONFERENCE ON ORIENTAL LANGUAGES (ICOL-2019)

# සාර සංක්ෂේප සඞ්ග්‍රහය
# PROCEEDINGS

145 YEARS OF EXCELLENCE

ANNIVERSARY
1873 - 1959 - 2019


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
UNIVERSITY OF SRI JAYEWARDENEPURA

24. **ආපදා සන්නිවේදනයේ දී භාවිතයට ගතහැකි ශ්‍රී ලංකාවේ ප්‍රදේශීය ජනවහර**
එම්. කේ. ජී. අයි. ධර්මසේන,
එච්. පී. කේ. එන්. හේවාවසම්,
පින්නවල සංඝසුමන හිමි

25. **ශ්‍රී ලංකාවේ භූගෝලීය ස්ථාන නාමකරණයේ දී භාවිත සමානාර්ථ පදයන්හි අවකාශීය ව්‍යාප්තිය**
ඩී. කේ. ඩී. ඒ. රණවීර,
කේ. එල්. තිසර සත්සර,
පින්නවල සංඝසුමන හිමි

26. **ස්ථානීය නාමකරණය පිළිබඳ භූ-වාග්විද්‍යාවේ පර්යේෂණාත්මක උපයෝගීතාව**
පින්නවල සංඝසුමන හිමි,
කුඩාකත්නෝරුවේ විනීත හිමි, පී.එච්. සමරසිංහ

27. **දක්ෂිණ ශ්‍රී ලංකාවේ ජනාවාස නාමකරණය කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳ විශ්ලේෂණයක්**
එම්. එල්. එස්. දිසානායක,
පී. ඩී. විජේසේකර,
පින්නවල සංඝසුමන හිමි

28. **විද්‍යෝදය පිරිවෙණෙන් සිංහල භාෂා සාහිත්‍යයට සිදු වූ දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**
**ගලගම කරුණාකර හිමි,**
**එන්. ඩබ්. ඩබ්.වී. හසිත සාරංග,**
**ආර්. ඉසංකා දමයන්ති වික්‍රමසිංහ**

# ශ්‍රී ලංකාවේ භූගෝලීය ස්ථාන නාමකරණයේ දී භාවිත සමානාර්ථ පදයන්හි අවකාශීය ව්‍යාප්තිය

ඩී. කේ. ඩී. ඒ. රණවීර, කේ. එල්. තිසර සත්සර සහ පින්නවල සංඝසුමන හිමි[1]

## හැඳින්වීම

ස්ථානය (Place) යනු බහුමානයෙන් යුතු, සංකීර්ණ අර්ථ නිරූපණ සහිත සංකල්පයකි. සමාජීය අනන්‍යතාව (Social identity) ගොඩනගා ගැනීමේ දී ස්ථානීයතාව ඉතා වැදගත් සාධකයක් වේ. එබැවින් ස්ථානය යනු සමාජීය, ආර්ථික, දේශපාලනික, භෞතික හා ඓතිහාසික ක්‍රියාවලීන්ගේ එකතුවකින් ගොඩනැගෙන අනුභූතියකි (Basso,1984). ඉංග්‍රීසි භාෂාවේ දී Place යන්න ව්‍යවහාරයට ගනුයේ පිහිටීම, භූමි භාගය, ස්ථානය, කොට්ඨාශය යන අර්ථයෙන්ය. ග්‍රීක භෂාවෙන් Plateia හා ලතින් භාෂාවෙන් Platea යන භාෂා රූප එයට භාවිතා කරන ලද්දේ වපසරිය, භූමිය, හතරැස් භූමිය යන අර්ථයෙනි. එය ජර්මන් බසින් ort and Rqum ලෙස හඳුන්වා දෙන අතර එහි අදහස පිහිටීමයි. චෙක් බසින් Misto a Prostor යන රූපය ස්ථානය හා අවකාශය යන අර්ථයෙන් භාවිතයට ගනී. ශ්‍රී සුමංගල ශබ්දකෝෂයේ ස්ථානය යනු පිහිටීම, අවකාශය, තැන, ඉඩම, ධූරය, තනතුර, සමීපය යන්නයි (සෝරත හිමි 1952). භූගෝල විද්‍යාත්මක අධ්‍යයනයන්හි දී ස්ථානය යනු විවිධ පර්යාලෝකනයන් ඔස්සේ විග්‍රහ කෙරෙන සංකල්පයකි. එය වඩාත් ගැඹුරින් විශ්ලේෂණය කළ යුතු බව Tim & Jim (2004) දක්වයි. ස්ථානීයතාව හා පිහිටීම යනු කිසියම් ජන කණ්ඩායමකගේ අනන්‍යතාව පිළිබිඹු කරන ප්‍රධාන

1 pssumana@sjp.ac.lk/ Principal author


අවධාරිතයකි. පුද්ගලයි තම අනන්‍යතාවය ගොඩනගාගනු ලබන්නේ ස්ථානීය සාධක මූලික කරගනිමිනි (Kevin Lyrch, 1960). ස්ථානීය අනන්‍යතාව ගොඩනගා ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුම තමන්ට අනන්‍ය ලක්ෂණ සහිත ප්‍රදේශය වෙන් කර ගත යුතුය. මා කවුද? අපි අනෙක් මිනිසුන් අතරින් වෙනස්වන්නේ ඇයි? යන්න කිසිවෙකු විමසූවිට ඔවුන්ට පුද්ගලානුබද්ධව හා ස්ථානීය සාධක මත පිළිතුරු ලබාදිය හැකි ය. ස්ථානය හඳුනාගැනීමේ ක්‍රියාවලිය (Identity Process) ස්ථානය සමඟ සම්බන්ධ වූ ජෛව විද්‍යාත්මක, භෞතික හා සමාජීය සැකැස්ම මත ගොඩනැගෙයි. ස්ථාන පිළිබඳ හැදෑරීම (Reading Places) වූ කලී බහුමානයන් ඔස්සේ සිදුකළ යුතු සංකීර්ණ ව්‍යායාමයකි. ස්ථානය පිළිබඳ හැඟීම (Sense of Place) සහ ස්ථානීය අනන්‍යතාව (Place identity) යන සාධක ස්ථාන නාමකරණයේ දී බලපා ඇති ප්‍රබල සාධක වශයෙන් දැක්විය හැකිය (Black, et. al. 1989).

### පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ ස්ථාන නාමකරණයේ දී භූභෞතික සාධක බොහොමයක් භාවිතයට ගෙන තිබේ. ඒවාට අමතර ව පුද්ගල මූලික සාධක මෙන්ම කුලය, ජීවනෝපාය, සමාජ තත්ත්වය, වාර්ගිකත්වය, ජනවහර මෙන්ම භූමිය මත පිහිටි විශේෂිත තත්වයන් ද සැලකිල්ලට ලෙන තිබේ (විනී විතාරණ, 1974). මුල් කාලයේ දී හේනක්, වත්තක්, ලන්දක් වූ ප්‍රදේශයක් පසුකාලීන ව ජනාවාස වී නගරයක් බවට පත්වුව ද එම නම ව්‍යවහාරයේ පවතින අවස්ථා විරල නොවේ. පල්ලියගොඩැල්ල යැයි කී විට එහි සංස්කෘතික ලක්ෂණයක් සමඟ භූ විෂමතා ලක්ෂණයක් ද නිරූපණය කරයි. වෙහෙරගලතැන්න යැයි කී විට වෙහෙර+ ගල + තැන්න යන ලක්ෂණ ත්‍රිත්වයේ සමුච්චිත රූපයක් ග්‍රාම නාමය බවට පත් වී තිබේ . සිංහල භාෂාව සංස්කෘත හා පාලි වැනි භාෂාවන්ගෙන් පෝෂණය ලැබ ස්වායත්ත අනන්‍යතාවයක් සහිතව නව්‍යකරණයට ලක් වෙමින් පවතින ආර්ය භාෂාවකි. සමානාර්ථ පද භාවිතයේ දී සිංහල භාෂාව සතු පොහොසත් බව කැපී පෙනෙන එක් අවස්ථාවක් වන්නේ ස්ථාන නාමකරණයයි

(අනුබුදු, 1987). ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකම ස්ථාන නාමකරණයේ ද බලපා ඇති භූගෝලීය ප්‍රපංචයක් වන වනාන්තරය නිදසුනක් ලෙස ගතහොත් ඒ සඳහා සමානාර්ථ පද 21 ක් පමණ ප්‍රාදේශීය ව්‍යවහාරයේ පවතී. එබඳු බොහෝ අවස්ථා ස්ථාන නාමකරණයේ දී දැකිය හැකිය. එබැවින් එකම ප්‍රපංචයක් අරුත් ගැන්වෙන එහෙත් විවිධ භාෂා රූපයන් සහිත ස්ථාන නාමයන්හි අවකාශීය ව්‍යාප්තිය කෙබඳුද? එම ව්‍යාප්තියෙහි දැකිය හැකි විශේෂතා මොනවාද? ඊට බලපා ඇති හේතු මොනවාද? යන කේන්ද්‍රීය ප්‍රශ්න පදනම් කර ගත් අවකාශීය විශ්ලේෂණය අරමුණු කර ගෙන මෙහි පර්යේෂණ ගැටළුව ගොඩනගා තිබේ. අංක 01 සටහනින් දැක්වෙන්නේ එහි සංකල්පීය රාමුවයි.

සංකල්පීය රාමුව - රූප සටහන් අංක 01




## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් ද්විතියික දත්ත මත පදනම් වූවකි. ශ්‍රී ලංකාවේ 1:63360 හා 1:50000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියම් ගත තොරතුරු භාවිතයට ගනිමින් පියවර පහක් යටතේ දත්ත රැස්කරන ලදී.

➤ සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන සේ නිර්මාණය කර ඇති ශ්‍රී ලංකා අඟලේ සිතියම් ඇසුරින් තෝරාගත් නිර්ණායක වලට අනුකූලව සිංහල ස්ථාන නාම තෝරා ගැනීම.

- එම ස්ථානයන්හි සාපේක්ෂ හා නිරපේක්ෂ පිහිටීම හඳුනා ගැනීම.
- එම ස්ථාන නාම ආශ්‍රිත භූගෝලීය පසුබිම (භූ විෂමතාව, දේශගුණය, පස, ස්වභාවික වෘක්ෂලතා, ජලාපවහන රටා) නූතන සිතියම් (ගුවන් ඡායාරූප, චන්ද්‍රිකා ප්‍රතිබිම්බ) ඇසුරින් අධ්‍යයනය කිරීම.
- තෝරා ගත් ස්ථානයන්හි අවකාශීය ව්‍යාප්තිය නිරූපණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධති සිතියම් (GIS) නිර්මාණය කිරීම.
- අවකාශීය විශ්ලේෂණය සිදු කිරීම.


ශ්‍රී ලංකාවේ ස්ථාන නාමකරණයේ දී බලපා ඇති භූගෝලීය ලක්ෂණ අති විශාල ප්‍රමාණයක් පවතී. එයින් වනාන්තරය, කන්ද, ගඟ, තැනිතලාව යන ලක්ෂණවලට අදාල සාමානාර්ථ පද අධ්‍යයනයේ සීමාවන් වශයෙන් පිහිටුවාගෙන ඇත.

## සොයා ගැනීම්

සිංහල සාමානාර්ථ පද බහුල වශයෙන් භාවිතයට ගෙන ඇති භූගෝලීය ස්ථාන සලකා බැලීමේ දී වනාන්තරය, කන්ද, තැනිතලාව, හා ජල මූලාශ්‍ර වැනි භූ ලක්ෂණ ප්‍රමුඛත්වයක් ගනී. ඒවා පදනම් කර ගනිමින් ස්ථාන නාම පට බැඳී ඇති ප්‍රදේශ පුළුල් ලෙස විශ්ලේෂණය කිරීමේ දී පෙනෙන්නේ වඩාත්ම භාවිතයට ගෙන ඇති භූගෝලීය ලක්ෂණය වනුයේ වනාන්තරය බවයි. භූගෝල විද්‍යාත්මකව විග්‍රහ කරන විට ස්වභාවික වෘක්ෂලතා කලාප විවිධය. වනාන්තර, ලඳු කැළෑ, තෘණ භූමි, පතන, දමන ආදිය ජෛව ලක්ෂණ අනුව වෙනස් වේ. එහෙත් සිංහල භාෂා ව්‍යවහාරයේ දී වනාන්තර හැඳින්වීම සඳහා පොදුවේ කැලය, ගොල්ල, ගොමුව, පැලැස්ස, පේ, ලන්ද, ආන, කඩව, මූකලාන, අරඹ, අරාව, වල, පොතාන, පොත, බැද්ද, වින්න, යාය, හේන, වන, කැටිය යන භාෂා රූප භාවිතා කර ඇත. කන්ද යන භූ ලක්ෂණය හැඳින්වීමට පර්වතය, ගිරිය, ගල , ගොඩ, මලේ, ගොඩැල්ල, කුළ යන භාෂා රූප භාවිත කොට ඇත. මෙකී සමානාර්ථ රූප ස්ථාන නාමකරණය

සඳහා යෙදී ඇති ආකාරය සලකන කල්හි ප්‍රාදේශීය විවිධත්වය කැපී පෙනේ. සිතියම් අංක 01 මගින් දැක්වෙන පරිදි වනාන්තර සඳහා භාවිත සාමානාර්ථ පද අතරින් වල යන අර්ථය රත්නපුර, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි බහුල වශයෙන් ද කැලය, මුකලාන යන්න මොණරාගල, හම්බන්තොට, බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ද අරාව, වින්න යන රූපය කෑගල්ල, නුවර, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි ද කැටිය යන්න මාතර, ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි ද පොතාන යන්න අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි ද අරඹ යන්න රත්නපුර, ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි ද ගොමුව කුරුණෑගල, අනුරාධපුර යන දිස්ත්‍රික්කයන්හි ද බහුල වශයෙන් ස්ථාන නාමකරණය සඳහා භාවිත කරයි. එසේම කන්ද සඳහා භාවිත සාමානාර්ථ පද අතරින් ගොඩ යන රූපය රත්නපුර, කලුතර, ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි ද ගල යන අර්ථය මොණරාගල, රත්නපුර, මාතලේ, කෑගල්ල යන දිස්ත්‍රික්කයන්හි ද ගිරිය යන්න නුවර, මාතලේ යන දිස්ත්‍රික්කයන්හි ද ස්ථාන නාමකරණය සඳහා බහුල වශයෙන් භාවිත කර ඇත. තවද තැනිතලා ප්‍රදේශය අරුත් ගැන්වෙන පිටිය යන භාෂා රූපය නුවරඑළිය, මාතලේ, කොළඹ සහිත කලාපයෙහි ද, පෝද්දුව යන්න ගාල්ල හා කළුතර සහිත කලාපයේ ද, තලේ යන්න අනුරාධපුර, පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි ද කැපී පෙනේ. ගංගාව සඳහා භාවිතයට ගෙන ඇති සමානාර්ථ පද අතර ගඟ, කඳුර, ඔය, ආර, ඇල යන සමා-නාර්ථ පද විශේෂ වෙයි. ශ්‍රී ලංකාවේ අත්තනගලු ඔයේ සිට කලා ඔය දක්වාත් ගල් ඔයේ සිට කුඹුක්කන් ඔය දක්වාත් කලාපයෙහි බහුලව භාවිතයට ගෙන ඇත්තේ ඔය යන භාෂා රූපයයි. කැළණි සිට වලවේ දක්වා පැහැදිලි ලෙස ගඟ යන්න ව්‍යවහාරයට ගෙන තිබේ. බහුතරයක් උතුරු පලාතේ ද නැගෙනහිර පලාතේ ඇතැම් ප්‍රදේශයන්හි ද ආර (ආරු) යන රූපය ගංගා නම් කිරීමේ දී යෙදී ඇත. තෙත් කලාපයේ ප්‍රාදේශීය මට්ටමින් කඳුර සහ ඇල භාවිතා කිරීම කැපී පෙනේ.

### සිතියම් අංක 01




## සමාලෝචනය

මෙම අධ්‍යයනය එක්තරා අයුරකින් ස්ථාන නාම විද්‍යාවට අයත් වන අතර තවත් අතෙකින් භූ-වාග්විද්‍යාත්මක පදනමක් ද නියෝජනය කරයි. විජයාගමනය පිළිබඳ ඓතිහාසික පුවතට අනුව තඹවන් පැහැති වෙරළක් ඇති හෙයින් තම්බපන්නිය ලෙස මුලින්ම නාමකරණය වූ ලක් දිව ක්‍රමයෙන් ජනාවාස බවට පත්වීමේ දී විවිධ සාධක පදනම් කරගෙන ස්ථාන නාමකරණය

සිදු වී තිබේ. සිංහල භාෂාවේ ඇති සමානාර්ථ පද භාවිතයේ පෙහොසත් බව මෙම අධ්‍යයනය සඳහා පසුබිම ගොඩනගා ඇත. ස්ථාන පිළිබඳ අධ්‍යයනයන්හි වර්තමානයේ වැදගත් ප්‍රවණතාවක් වන්නේ අවකාශීය විශ්ලේෂණය සඳහා නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රම භාවිතයට ගැනීමයි. පෙරට වඩා කාර්යක්ෂම වූත් නිවැරදි වූත් ස්ථානීය පිහිටීම් පිළිබඳ විශ්ලේෂණය කිරීමට භූගෝලීය තොරතුරු පද්ධති ක්‍රමවේදය මගින් පර්යේෂණ සඳහා ඉඩ ප්‍රස්ථා ඇති වී තිබේ. ශ්‍රී ලංකාවේ ස්ථාන නාමකරණයෙහි අවකාශීය විවිධත්වය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ කලාපීය අනන්‍යතාව එමගින් පිළිබිඹු වීමයි. ස්ථාන නාමකරණය සඳහා ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරය සෘජු බලපෑමක් සිදු කර තිබේ. එකම භූගෝලීය ලක්ෂණය සඳහා භාවිතයට ගන්නා විවිධ භාෂා රූපයන්ගේ රාශීභූත වීම තුළින් ප්‍රාදේශීය විවිධත්වය කැපී පෙනේ. ඇතැම් නාම සම්බන්ධයෙන් මෙකී ව්‍යාප්ති රටාවෙන් පරිබාහිර තතවයන් ද දක්නට ලැබෙයි. ජනාවාස විකාසනයේ දී සිදු වූ සංක්‍රමණ මෙන්ම වෙනත් සාධක ද ඊට බලපා ඇතැයි අනුමාන කළ හැකිය. මෙම පදනම මත ශ්‍රී ලංකාවේ ස්ථාන නාමකරණය පිළිබඳ අධ්‍යයන්හි අනාගත පර්යේෂණ අවස්ථා රැසක් පවතින බව පෙන්වා දිය හැකිය.

මුඛ්‍ය පදඃ අවකාශීය විශ්ලේෂණය, නාමකරණය, සමානාර්ථ භාෂා රූප, ස්ථානීය අනන්‍යතාව

## මූලාශ්‍රය

අභුබුදු ඒ. (1987), ලංකා ගම් නම් වහර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

විනී විතාරණ, (1974), සාහිත්‍යයෙන් භූගෝලයඃ ලංකාව, අමර මුද්‍රණ ශිල්පියෝ, උණවටුන.

සෝරත හිමි, (1952), ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

(2008), ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය, ගුණසේන සමාගම, කොළඹ.

Basso, K. H. (1984), Western apache place name hierarchies. In : Tooker, E.(ed), Naming system:, American Ethnological So city, Washington, DC.

Black, W.D et. al. (1989), Commonplaces: Essays on the Nature of Place, University Press of America.